**ශ්‍රී ලංකා භූ විද්‍යා ආයතනය - 2016**

---

ශ්‍රී ලංකා භූ විද්‍යා ආයතනයේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2014 අංක 3 දරන ශ්‍රී ලංකා භූ විද්‍යා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනතේ 10 වගන්තිය සමග සංයෝජිතව කියවියයුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාරව ආයතනයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් සහ නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

---------------

### 2.1 මතය

--------

මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා භූ විද්‍යා ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---------------------------------------------

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

--------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2015 වර්ෂයට අදාළව සමාලෝචිත වර්ෂයේදී වැයකර තිබූ රු.30,000 ක් සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය එම මුදලින් අඩුවෙන් දැක්වුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශනවල 2015 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු සාමාජික ගාස්තුව රු.154,500 ක් ලෙස දක්වා තිබුණද, හිඟ සාමාජික මුදල් ලේඛනය එදිනට අයවියයුතු මුදල රු. 277,500 ක් ලෙස හඳුනාගෙන තිබුණි. ඒ අනුව අදාළ දෝෂය නිවැරදි කිරීම සඳහා සමුච්චිත අරමුදලට රු. 123,000 ක් බැර කිරීම වෙනුවට රු.119,500 ක් බැර කර තිබීම හේතුවෙන් සමුච්චිත අරමුදල් ශේෂය රු.3,500 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) කාරක ප්‍රාග්ධන සංචලනයන් යටතේ දක්වා තිබුණු ලැබියයුතු වත්කම්වල වැඩිවීම රු. 398,500 ක් වියයුතු වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ එය රු. 279,000 ක් ලෙස දැක්වීම හේතුවෙන් මුදල් ගලායාම රු. 119,500 ක් අඩුවෙන් දක්වා තිබුණි.

### 2.3 නීති රීති රෙගුලාසිවලට අනුකූල නොවීම

---------------------------------------------------

2014 අංක 03 දරන ශ්‍රී ලංකා භූ විද්‍යා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනතේ 11 (1) වගන්තිය ප්‍රකාරව සභාව විසින් සංස්ථාවේ කටයුතු පිළිබඳ වාර්තාවක් සෑම මුදල් වර්ෂයක් සඳහාම සකස් කළයුතුය. තවද, එම වාර්තාව විගණනය කරන ලද ගිණුම් ප්‍රකාශනය සමග ඊළඟ වර්ෂයේ සය මාසයක් ඉකුත්වීමට පෙර පරිසර විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත හා 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම හා අධීක්ෂණය කිරීම) පනත යටතේ පත් කරන ලද ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවත් සභාව විසින් එවැනි වාර්තාවක් පිළියෙල කර නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵලය

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 දෙසැම්බැර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු.419,289 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.371,363 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 47,926 ක වර්ධනයක් වී තිබුණි. සමාලෝචිත වර්ෂයේ වාර්ෂික සාමාජික ගාස්තු ආදායම රු.93,500 කින් එනම් සියයට 16 කින් වැඩි වී තිබීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

-------------------------------

### 4.1 කාර්යසාධනය

-----------------

2014 අංක 03 දරන ශ්‍රී ලංකා භූ විද්‍යා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත ප්‍රකාරව ආයතනයේ ප්‍රධාන පරමාර්ථ පහත පරිදි වේ.

(අ) භූ විද්‍යාවට අදාළ දැනුම අත්කර ගැනීම, ව්‍යාප්ත කිරීම සහ දැනුම හුවමාරු කිරීම,

(ආ) භූ විද්‍යාත්මක කරුණු පිළිබඳව පර්යේෂණාත්මක කටයුතු දිරි ගැන්වීම,

(ඇ) විවිධ ශ්‍රේණිවල සාමාජිකත්වයට ඇතුළත් කිරීම සඳහා අයදුම්කරුවන්ගේ සුදුසුකම් පරීක්ෂා කිරීම;

(ඈ) එහි වෘත්තීමය කටයුතු පාලනය කිරීම සහ එහි සාමාන්‍ය ක්‍රියාකාරකම්වල උසස් තත්ත්වයන් පවත්වා ගැනීමට ආධාර කිරීම,

(ඉ) භූ විද්‍යාත්මක වෘත්තීය කටයුතුවලට අදාළ සියලු කාරණාවලදී වෘත්තීමය සහ සදාචාරාත්මක ප්‍රතිපත්ති සහ ප්‍රමිතීන් ප්‍රවර්ධනය කිරීම සහ පවත්වාගෙන යාම සහ ක්‍රියාත්මක කිරීම,

(ඊ) භූ විද්‍යාඥයින්ගේ අභිලාශයන් සහ තත්ත්වය වැඩි දියුණු කිරීම සහ ප්‍රවර්ධනය කිරීම,

(උ) රටේ අභිවෘද්ධියට හා සංවර්ධනයට අදාළ කටයුතු වලදී භූ විද්‍යාව අදාළ කර ගැනීම හා සම්බන්ධ කාරණාවලදී රාජ්‍ය හා පෞද්ගලික ආයතනවලට සේවා සැපයීම සහ

(ඌ) ආයතනයේ පරමාර්ථ වැඩිදියුණු කිරීමෙහිලා ශ්‍රී ලංකාවේ සහ වෙනත් රටවල සමාන වෘත්තීමය ආයතන සමග සම්බන්ධීකරණය ඇති කිරීම.

ඉහත සඳහන් පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා 2015 වර්ෂයේදී සිදුකරන ලද පහත විස්තර සඳහන් ක්‍රියාමාර්ගයන් සමාලෝචිත වර්ෂයේදීද අඛණ්ඩව ඉදිරියට මෙහෙයවා තිබුණි.

(i) භූ විද්‍යාවට අදාළ දැනුම අත්කර ගැනීම හා ව්‍යාප්ත කිරීම වෙනුවෙන් නිර්මාණය කරන ලද වෙබ් අඩවිය පිළිබඳව සාමාජිකයන් දැනුවත් කිරීම හා ප්‍රචලිත කිරීමට ක්‍රියාකර තිබුණි.

(ii) භූ විද්‍යාත්මක කරුණු පිළිබඳව පර්යේෂණාත්මක කටයුතු දිරිගැන්වීමේ උපක්‍රමයක් ලෙස වරලත් භූ විද්‍යාඥයන් තෝරා ගැනීමේදී ඔවුන්ගේ පර්යේෂණ පදනම් කර ගැනීමේ ක්‍රමවේදය අඛණ්ඩව ක්‍රියාවට නංවා තිබුණි.

(iii) සාමාජිකයන් ශ්‍රේණිගත කිරීම සඳහා පත්කරන ලද ප්‍රවේශ හා ආචාරධර්ම ව්‍යවහාර කමිටුව (Admission & Ethical Practices Committee) හරහා සමාලෝචිත වර්ෂය තුළදී ආශ්‍රිත සාමාජිකයන් 12 දෙනෙක් හා වරලත් භූ විද්‍යාඥයන් 22 දෙනෙකු තෝරා පත් කරගෙන තිබුණි.

(iv) භූ විද්‍යාඥයින්ගේ අභිලාෂයන් සහ තත්ත්වය වැඩිදියුණු කිරීම සහ ප්‍රවර්ධනය කිරීමට තෝරාගත් වරලත් භූ විද්‍යාඥයින් විසි දෙදෙනා හරහා රටෙහි අභිවෘද්ධිය හා සංවර්ධන කටයුතු වලදී භූ විද්‍යාව අදාළ කර ගැනීම හා සම්බන්ධ කාරණා වලදී රාජ්‍ය හා පෞද්ගලික ආයතනවලට සේවා සැපයීමට අවශ්‍ය පහසුකම් සකස් කර තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

---------------------------------------------

### 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

**--------------------------------**

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය පරිදි ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත අදාළ වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත්, 2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරන ලද්දේ 2017 නොවැම්බර් 16 දිනදීය.

## 6. පද්ධති හා පාලනයන්

--------------------------

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර ආයතනයේ සභාපතිවරයා වෙත යොමු කරන ලදී. සාමාජික ගාස්තු ආදායම ගිණුම්ගත කිරීමේ දුර්වලතා නිවැරදි කිරීම් සම්බන්ධයෙන් තවදුරටත් විශේෂ අවධානය යොමු කළ යුතුය.